Supporting Effective Dispute Resolution
එලදායීව ආරවුල් නිරාකරණයට සහායවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# Supporting Effective Dispute Resolution

# Your document title

<u>ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය:</u>

*"සාධාරණ විකල්පයක් ශක්තිමත් කිරීම - SEDR වෙතින් පාඩම් සහ ගැඹුරු දැනුම"*

## 1. <u>සැසිවාරයේ මාතෘකාව</u>

තේමාත්මක සැසිවාර අංක 4:

*ප්‍රජා මට්ටමේ විකල්ප ආරවුල් නිරාකරණයේදී (ADR) තරුණයින්ගේ කාර්යභාරය*

උප සැසිවාරය ii) අනාගත සමථකාරවරුවන්ගේ කාර්ය මණ්ඩලයක් ගොඩනැගීම.

## 2. <u>දිනය, වේලාව සහ ස්ථානය</u>

2025 අප්‍රේල් 29 – තේමාත්මක සැසිවාර 4 (තේ පානයෙන් පසු)
15:45 – 16:30 (පාසල් සමථ වැඩසටහන)
ස්ථානය: ඕක් කාමරය, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලය

Part of the programme
STRIDE
Funded by the European Union
Implemented by
British Council
The Asia Foundation

## 3. <u>සංකල්පයේ සාරාංශය / හැඳින්වීම</u>

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ අත්දැකීම්වලට සමථ සේවා පිළිබඳ අවබෝධයක් ඇතුළත් කිරීමේ වැදගත්කම සමථ මණ්ඩල කොමිෂන් සභාව (MBC) විසින් හඳුනා ගනු ලබයි. 2004 සහ 2012 අතර කාලය තුළ බ්‍රිටිෂ් කවුන්සිල් ආයතනය විසින් *'ද්විතියික පාසල්වල සමථ ව්‍යාපෘතිය'* ක්‍රියාත්මක කිරීම සඳහා MBC වෙත මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දුන් අතර එම සහාය තුළින් පාසල් මට්ටමින් ගැටුම් නිරාකරණය කිරීම සඳහා ඵලදායී ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් සහ මෙවලමක් ලෙස අවබෝධය ඇති කිරීම මඟින් ද්විතීයික පාසල් මට්ටමින් සමථ කිරීමේ කටයුතු හඳුන්වාදීමට සහාය විය. උපදේශන කටයුතු යටතේ ධාරිතා වර්ධනය සහ නිරාවරණ චාරිකාවන් ඇතුළු ක්‍රියාකාරකම් ඇතුළත් විය. මෙම ව්‍යාපෘතියට පළාත් නවය පුරාම පිහිටි පාසල් 250 ක සමථ ඒකක ස්ථාපිත කරන ලද අතර, සිසුන් 5,000 ක් සහ ගුරුවරුන් 1,250 කට සමථ කිරීම පිළිබඳ සංකල්ප සහ ශිල්ප ක්‍රම පිළිබඳව පුහුණුවීම් ලබාදෙන ලදී.

SEDR සහාය මඟින් MBC හි පාසල් සමථ වැඩසටහනේ (SMP) තත්ත්වය තක්සේරු කිරීම 2022 වසරේ දී අවසන් කරන ලද අතර මෙම SMP වැඩසටහනට අඛණ්ඩව සහාය දැක්වීම සඳහා ව්‍යාපෘතියක් ද සංකල්පනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය a) පාසල් පසුබිම තුළ සුළු ආරවුල් නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පද්ධති ගොඩනැගීම සහ b) සිසුන් අතර සමථ කිරීම පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය වැඩි කිරීම සඳහා කටයුතු කිරීම යන කාර්යයන්වල එකතුවකි. අනාගතයේදී පාසල් පරිසරයෙන් ඔබ්බට සමථ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකි තරුණ පරම්පරාවක් අතර සමථ ප්‍රවේශයන් සහ ඒවායේ උපයෝගීතාව පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ වක්‍ර ඉලක්කයක් වනු ඇත. අනාගතයේදී ප්‍රජාව/විශේෂිත සමථ මණ්ඩල සඳහා නව පරම්පරාවේ සමථකාරවරුන් ලෙස ක්‍රියා කිරීමට ද පාසල් සමථකාරවරුන්ට හැකියාවක් ඇත.

2022 සහ 2025 අතර කාලය තුළ MBC හි පාසල් සමථ වැඩසටහනට SEDR විසින් ලබාදෙන ලද සහයෝගයේ කොටසක් ලෙස, SMP හි පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) පාඨමාලාව, SMP ගුරු පුහුණු වැඩසටහන මෙන්ම SMP ශිෂ්‍ය පුහුණු පාඨමාලාව සඳහා විෂයමාලා සහ පුහුණු ද්‍රව්‍ය සංශෝධනය කර යාවත්කාලීන කරන ලදී. සංවර්ධන නිලධාරීන් 92 දෙනෙකු SMP පුහුණුකරුවන් ලෙස සාර්ථකව පුහුණු කිරීම සඳහා මෙම නව ද්‍රව්‍ය භාවිතා කරන ලද අතර, ශ්‍රී ලංකාවේ පළාත් 9 පුරා පිහිටි පාසල්වල සමථ ඒකක 58 ක එම සංවර්ධන නිලධාරීන් විසින් ගුරුවරුන් 284 දෙනෙකු SMP අධීක්ෂකවරුන් ලෙස ද සිසුන් 1,740 දෙනෙකු සම-සමථකාරවරුන් ලෙස ද පුහුණු කරන ලදී.

මෙම සැසිවාරයේදී MBC හි පාසල් සමථකරණ වැඩසටහනේ පසුබිම සහ සියුම් සන්දර්භයක් බෙදා ගන්නා ජ්‍යෙෂ්ඨ සමථකරණ වැඩසටහන් නිලධාරියෙකුගේ අත්දැකීම් ලබාගන්නා සැසිවාරයක් වනු ඇත. ඉන් අනතුරුව, MBC හි ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයෙකු මෙන්ම දශකයකට වැඩි කාලයක් පූර්ණ ක්‍රියාකාරී සමථකරණ ඒකකයක් පවතින පාසලක විදුහල්පතිවරයෙකු වැනි අය සහභාගී වන මධ්‍යස්ථ මණ්ඩල සාකච්ඡාවක් පවත්වනු ලැබේ.

## 4. <u>සැසිවාරයේ පරමාර්ථ</u>

- MBC හි පාසල් සමථ කිරීමේ වැඩසටහනේ සහභාගිවන්නන් සමඟ කෙටි හැඳින්වීමක් සහ පසුබිමක් පිළිබඳ බෙදා ගැනීම.

- MBC හි පාසල් මැදිහත්වීමේ වැඩසටහනේ ප්‍රවේශය සහ ක්‍රමවේදය පිළිබඳව ද ද්විතීයික පාසල් මට්ටමින් උනන්දුව මත පදනම් වූ සමථ කිරීමේ සංකල්පය හඳුන්වා දීම වැදගත් වන්නේ මන්ද යන්න පිළිබඳව ද සහභාගිවන්නන්ගේ දැනුම ගැඹුරු කිරීම.
- තරුණ වියේදී ඇති කරන ලද ආරවුල් නිරාකරණය කිරීමේ දැනුම සහ කුසලතා ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කළ හැකි ආකාරය ගවේෂණය කිරීම.

## 5. <u>මධ්‍යස්ථකරු / පහසුකම් සපයන්නා</u>

මධ්‍යස්ථකරු: ආචාර්ය දයානි සුමිත්‍රා පනාගොඩ, ස්වාධීන උපදේශක.

## 6. <u>කථිකයන් / විශේෂඥ කණ්ඩායමේ සාමාජිකයන් / ඉදිරිපත් කරන්නන්</u>

- ඉදිරිපත් කරන්නිය: තුෂාරි බාලසූරිය මහත්මිය,  සමථකරණ වැඩසටහන් නිලධාරිනී
- විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාව: තිළිණි රත්නසූරිය මහත්මිය, ලේකම්, MBC
- විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාව: වාසනා සුරංගි වික්‍රමසිංහ මහත්මිය, අතිරේක ලේකම් (ප්‍රතිසංස්කරණ) අධ්‍යාපන අමාත්‍යාංශය
- විශේෂඥ කණ්ඩායමේ සාමාජිකාව: ඩබ්ලිව්.ඒ.මේනකා වෙත්තසිංහ මහත්මිය, විදුහල්පතිනි, කෑගල්ල, ස්වර්ණජයන්ති විද්‍යාලය